# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2190/26 - 2020 අගෝස්තු මස 25 වැනි අඟහරුවාදා - 2020.08.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 06

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1887/21 හා 2014.11.05 දිනැති, අංක 1905/07 හා 2015.03.09 දිනැති, අංක 2006/53 හා 2017.02.17 දිනැති, 2049/14 හා 2017.12.12 දිනැති සහ අංක 2138/27 හා 2019.08.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත, අංක 1836/6 හා 2013.11.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 අගෝස්තු මස 20 වැනි දින.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 10.1.1, 10.2.1, 10.3.2 හා 11.3 ඡේද පහත පරිදි සංශෝධය කරනු ලැබේ.

**10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම**

**10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව**

10.1.1.1 (vii) වගන්තිය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවෙන් ඉවත් කරනු ලැබේ.

**10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම**

**10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්**

(iv) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම හා එම වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යමින් තිබීම.


1A - G 32752— 26 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**10.3.2 උසස් කිරීමේ ක්‍රමය**

10.3.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සෑම වසරකම ජූලි මස 01 හා ජනවාරි මස 01 වැනි දිනට පවත්නා පුරප්පාඩු අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

සටහන

1. (i) සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන කිසියම් කාණ්ඩයක පවතින පුරප්පාඩු සඳහා උසස් කිරීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ, පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට එම කාණ්ඩයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව, අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාව නොඉක්මවන 10.3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාවක් පමණි.

හා

(ii) කාණ්ඩ කීපයක් සඳහා පොදු තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා උසස් කිරීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ, පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට එකී කාණ්ඩවල I ශ්‍රේණියේ නිලධාරීන්ගේ පොදු ජ්‍යෙෂ්ඨතාවය අනුව, පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට පවත්නා සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාව නොඉක්මවන 10.3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාවක් පමණි.

2. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කිරීම පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

3. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 70 ට අනුකූල වන සේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසුව ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව, පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව, පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**11.3 තෝරා ගනු ලබන ක්‍රමය**

(අ) එලෙසම පවතිනු ඇත.

(ආ) එලෙසම පවතිනු ඇත.

(ඇ) එලෙසම පවතිනු ඇත.

(ඈ) විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු :

විශේෂ ශ්‍රේණියේ පවත්නා තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පරිපාලන බලධාරියා විසින් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධියට පත්කර විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 70 ට අනුකූල වන සේ පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, ජ්‍යෙෂ්ඨතාවය හා ඉංජිනේරුමය විෂයන් පිළිබඳ ලබා ඇති විශේෂ හෝ විශේෂඥ දැනුම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත පටිපාටියකට අනුව පරීක්ෂා කිරීමෙන් පසුව ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව තනතුරු සඳහා පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

09 - 207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.